මගේ අංකය: JSC/SEC/CIR – L /2023

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 17/2023**

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,

**ශ්‍රී ලංකාවේ විවිධ අධිකරණවල අධිකරණ කටයුතු වලට අදාල ඉපැරණි කෞතුක අධිකරණ භාණ්ඩ සම්බන්ධවයි.**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් මා අමතා ඇති අංක:**MOJ/REF/A/COMMON/2023** හා 2023.02.28 දිනැති ලිපියේ (ඇමුණුමද සමඟ) දෙවන යෝජනාවට අදාලව (පිටපත් අමුණා ඇත) මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංගමය වෙතින් ප්‍රතිචාර කැඳවන ලදුව, ප්‍රතිචාර කිහිපයක් පමණක් ඉදිරිපත් වීම සැලකීමටගත් අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියේ දෙවන යෝජනාව ප්‍රකාරව වූ කෞතුක භාණ්ඩ ඔබ අධිකරණයේ පවතී නම්, ඒ පිළිබඳ සියලු විස්තර අධිකරණ සේවා කොමිෂන් සභාවට පිටපතක් සහිතව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කිරීමට පියවරගන්නා ලෙසට ඔබට දැන්වීමට මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 ජූලි මස 12 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

පිටපත : ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, - දැ.ගැ.ස
කොළඹ 10.

දුරකථන / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

ඊ-මේල් / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk

නො 19, ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10
இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த
கொழும்பு 10
No 19, Sri Sangaraja Mw
Colombo 10

# අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
# நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
# Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

මගේ අංකය / எனது இல / My No. MOJ/REF/A/COMMON/2023

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 2023.02. 24

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT - COLOMBO 12
07 MAR 2023

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

<u>මහාධිකරණ විනිසුරුන්ගේ සංගමයේ යෝජනා</u>

උක්ත හිසින් මා වෙත එවා ඇති ජනාධිපති ලේකම්ගේ 2023.02.09 දිනැති ලිපිය (ඇමුණුම 01) හා බැඳේ.

මහාධිකරණ විනිසුරුන්ගේ සංගමයේ විධායක සභාව සහ ගරු ජනාධිපතිතුමා අතර සාකච්ඡාවේදී පහත යෝජනා ඉදිරිපත් කර ඇත.

1. කඩදාසි රහිත (Paperless) සහ ඩිජිටල් තාක්ෂණයෙන් යුතු උසාවියක් නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීම.
2. ශ්‍රී ලංකාවේ විවිධ අධිකරණවල අධිකරණ කටයුතු වලට අදාළ ඉපැරණි කෞතුක අධිකරණ භාණ්ඩ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කිරීම.

උක්ත 1 කරුණ සම්බන්ධයෙන් නියමු ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සුදුසු මහාධිකරණයක් යෝජනා කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

උක්ත 2 කරුණ සම්බන්ධයෙන්, අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ දළ අදහසක් ගැනීම සඳහා, උසාවි වලින් එකතු කරගත හැකි කෞතුක භාණ්ඩ ලේඛණයක් ලබා දෙන්නේ නම් ඒ සඳහා සුදුසු ස්ථානයක් වෙන් කර ගැනීම සඳහා කටයුතු කළ හැකි බව තවදුරටත් දන්වා සිටිමි.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

Fax

ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

RECEIVED
10 FEB

මගේ අංකය : PS/PSB/Misc/2023/01
දිනය : 2023 පෙබරවාරි මස 09 වන දින

වසන්තා පෙරේරා මහත්මිය
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

ප්‍රිය ලේකම්තුමියනි

<u>මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංගමයේ යෝජනා</u>

2023.02.09 වන දින මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංගමයේ විධායක සභාව ගරු ජනාධිපතිතුමා හමු වූ අවස්ථාවේදී සාකච්ඡා කිරීම් අතරතුර පහත සඳහන් යෝජනා ද ඉදිරිපත් කරන ලදී.

1. කඩදාසි රහිත (Paperless) සහ ඩිජිටල් තාක්ෂණයෙන් යුතු උසාවියක් නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීම

2. ශ්‍රී ලංකාවේ විවිධ අධිකරණවල අධිකරණ කටයුතු වලට අදාළ ඉපැරණි කෞතුක අධිකරණ භාණ්ඩ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කිරීම

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා මෙන් ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි කාරුණිකව දන්වනු කැමැත්තෙමි.

ස්තුතියි.

මෙයට - විශ්වාසී

ඊ එම් එස් බී ඒකනායක
ජනාධිපති ලේකම්

දුරකථන : +94-112354420 ෆැක්ස්: +94-112446657
විද්‍යුත් තැපැල : prsec@presidentsoffice.lk

<u>පිටපත :</u>

ගරු ලේකම්තුමා - කරු දැ.ගැ.ස
මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංගමය